## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය - 2010

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මතය

-----

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකය.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම්

---------------------------------------

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

----------------------------

ප්‍රමිත 18 අනුව වත්කම් විකිණීමේ ලාභ අලාභ විධිමත්ව ගණනය කර හෙළිදරව් කර නොතිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් වූ අධිකාරියේ පරපාලිත සමාගමක් වන මහවැලි ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම විසින් 2007 න් පසු මූල්‍ය ප්‍රකාශන සකස් කර නොතිබ අතර අවසන් වරට සකස් කල මූල්‍ය ප්‍රකාශන අනුව එම සමාගමේ වත්කම් රු: මිලියන 9.6 ක් විය. මීට අමතරව ආශ්‍රිත සමාගමක් වූ මහවැලි පශු සම්පත් ව්‍යාපාර සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු:73,992,312,363 ක් වූ අනෙකුත් මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) වැඩ නිමකර තබූ ඉදිකිරීම් හඳුනාගෙන ස්ථාවර වත්කම් වලට මාරුකිරීම හෝ රේඛීය ආයතන වලට පවරා දුන් වත්කම් ගිණුම්වලින් ඉවත් කිරීම සිදු කර නොතිබුණි.

(ii) මහවැලි ක්‍රීඩා වියදම් වැනි පුනරාවර්තන ස්වභාවයේ වියදම් ද අනෙකුත් මූල්‍ය වත්කම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(iii) අධිකාරිය යටතේ ක්‍රියාත්මක කරන ලද වැඩ අවසන් වී ඇති ව්‍යාපෘති 04 ක රු:46,380,139,021 ක් වූ පරිපාලන වියදම් ඇතුලු සමස්ථ වියදම ද මෙම ශේෂයට ඇතුලත් වී තිබුණි.

(ඈ) 2010 දෙසැම්බර් 31 දිනට තුලනය නොවූ අන්තර් කලාප ජංගම ගිණුම් හර ශේෂ රු:1,430,000 ක් ද බැර ශේෂ රු:4,804,000 ක්ද පැවති අතර එම ශේෂයන් ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් යටතේ ගලපා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරියේ සේවකයන්ට ගෙවා තිබූ රු:16,921,200 ක් වූ උත්සව අත්තිකාරම් වලින් කරන ලද අයකිරීම් චක්‍රිය අරමුදල් ගිණුමට ගිණුම්ගත කර තිබුණි. " මෙසේ අත්තිකාරම් අයකිරීම් චක්‍රීය අරමුදල් ගිණුමේ තැන්පත් කිරීමට හේතුව වූයේ මහා භාණ්ඩාගාරයෙන් අමතර ප්‍රතිපාදන උත්සව අත්තිකාරම් වෙනුවෙන් ලබා නොදෙන නිසා බවත් ඒ අනුව සෑම වසරකම උත්සව අත්තිකාරම් ගෙවීමේදී මෙම චක්‍රීය ගිණුමට බැර කරන ලද මුදල් උපයෝගි කරගනු ලබන බවත් අධ්‍යක්ෂ ජනරාල්වරයා මා වෙත දන්වා එවා තිබුණි. ”

(ඉ) මහවැලි කේන්ද්‍රයේ වාර්ෂික ආදායම රු: 78,993 ක් හා ආපසු ගෙවිය යුතු තැන්පත් රු: 10,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

1.2.3 නොසැසඳු පාලන ගිණුම්

(අ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සහ වත්කම් ලේඛනවල සඳහන් ස්ථාවර වත්කම් වටිනාකම අතර රු:288,489 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමුච්චිත අරමුදලේ 2010 ජනවාරි 01 දිනට ශේෂය රු: 98,404,890,000 ක් වුවත් ගිණුම්වල එය රු: 98,391,489,000 ක් ලෙස දක්වා තිබූ හෙයින් රු: 13,401,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වෙළඳ හා අනෙකුත් ශේෂවල එකතුව රු: 1,135,989,000 ක් විය. ඉන් රු: 75,387,000 ක් වර්ෂ 5 ඉක්ම වූ ශේෂයන වන අතර රු: 33,404,000 ක ශේෂයන් වර්ෂ 03 ත් 05 ත් අතර කාලපරිච්ඡේදයකට අදාල විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) 2010 දෙසැම්බර් 31 දිනට හිඟ බදු කුලී ආදායම රු: 315,460,000 ක් වූ අතර එයින් රු: 67,068,856 ක් මහා පරිමාණ ව්‍යාපාරික ආයතන හා රාජ්‍ය ආයතන 28 කට අදාල ඒවා බව අනාවරණය විය.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවූ වැඩ පූර්ව අත්තිකාරම් වටිනාකම රු: 295,324,000 ක් වූ අතර එයින් වර්ෂ 5 කට වැඩි කාලයක් ඉක්ම වූ අත්තිකාරම් වටිනාකම රු: 20,954,000 ක් විය. ඊට ඇතුළත් රු: 18,293,228 ක් වූ ශේෂයන්ට අදාල ව්‍යාපෘති 2 ක් වසර ගණනාවකට පෙර අවසන් කර ඇති බැවින් අදාල නෛතික ක්‍රියාමාර්ග ගැනීමටද අපහසු වී ඇති බැව් විගණනයේදී අනාවරණය විය.

(iii) සමාලෝචිත වර්ෂය අවසානයට "ගිණුම් මත ගෙවීම්" (On Account Payment) ගණුමේ ශේෂය රු: 44,194,000 ක් වූ අතර එයින් රු: 12,896,000 ක් වූ ශේෂයන් වර්ෂ 5 කට වඩා පැරණි ඒවා විය. මේ සම්බන්ධ කිසිදු විස්තරාත්මක උපලේඛනයක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(iv) 2008 වර්ෂයේ සිට වරින් වර වනජීවී දෙපාර්තමේන්තුව ලබාදී තිබූ අත්තිකාරම් රු: 42,417,000 ක් නිරවුල් කරගෙන නොතිබණි.

(v) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු: 48,217,000 ක් වූ විවිධ ණය ගැතියන් සහ වෙළඳ ණය ගැතියන් අතරින් රු: 14,591,000 ක් වූ ශේෂයන් වසරකට වඩා පැරණි ශේෂයන් විය. එයින් 2011 නොවැම්බර් මාසය වන විට රු: 6,299,585 ක් අයකරගෙන තිබුණි.

(vi) 2010 දෙසැම්බර් 31 දිනට නොපියවූ සුළු මුදල් අත්තිකාරම් වටිනාකම රු: 1,266,000 ක් වූ අතර එයින් රු: 407,000 ක් වූ අත්තිකාරම් වර්ෂ 5 කටත් වඩා පැරණි ශේෂයන් විය.

(ආ) වර්ෂ 5 ඉක්ම වූ රඳවා ගැනීමේ මුදල් රු: 13,240,000 ක් සහ වර්ෂ 3 ඉක්ම වූ විවිධ ණය හිමියන් රු: 8,940,000 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

පහත සඳහන් විෂයයන් සම්බන්ධව ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවුණි.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු: | |
| (අ) | දඹුල්ල යාන්ත්‍රික වැඩපල පිහිටුවීම | ගණනය කර නොමැත | පිහිටුවීමට අදාල අධ්‍යක්ෂ මණ්ඩල තීරණ |
| (ආ) | ඇමතුම් තැන්පතු | 93,969,000 | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය |
| (ඇ) | තැන්පතු | 4,637,000 | විස්තරාත්මක උපලේඛන සහ ශේෂ සනාථ කිරීම් |

1.2.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------

පහත සඳහන් නීති, රීති,රෙගුලාස සහ කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මූල්‍ය කාර්ය පරිපාටිය<br>- 1.5.1 වගන්තිය | ප්‍රාදේශීය මිලදී ගැනීම් සඳහා වූ අත්තිකාරම් ඒවා ලබාගෙන දින 7ක කාලයක් තුල පියවිය යුතු වුවද, මාස 6 සිට වර්ෂ 5 දක්වා කාල සීමාවක් තුල නොපියවා තිබූ අත්තිකාරම් වටිනාකම රු: 1,345,000 ක් විය.<br><br>2011 නොවැම්බර් මස වන විට මෙම මුදලින් රු: 555,000 ක් අයකරගෙන තිබූ බව අධ්‍යක්ෂ ජනරාල්වරයා මා වෙත වාර්තා කර තිබුණි. |

| | |
|---|---|
| - 1.5.2 වගන්තිය | අත්තිකාරම් ලබාගෙන මාස 2ක් ඇතුලත මුළු අත්තිකාරම් මුදලම පියවිය යුතු වුවත් රු.265,000 ක්වූ විවිධ අත්තිකාරම් නොපියවා වර්ෂ 3 කට වැඩි කාලයක් තිස්සේ පියවා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයෙ xxiv පරිච්ජේදයෙ 13.4 වගන්තිය. | උත්සව අත්තිකාරම් මාස 10 ක කාලයක් තුල දී අයකර ගත යුතු වුවද, එසේ අය නොකල වර්ෂය ඉක්මවූ උත්සව අත්තිකාරම් වටිනාකම රු.83,000 ක් විය. |
| (ඇ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 02 වගන්තිය | සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජයට පවරා ගත් සමාගම් වල සේවකයින්ට ගෙවිය හැකි වනුයේ අමාත්‍ය මණ්ඩල හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ මහා භාණ්ඩාගාරය විසින් හෝ අනුමත කරනු ලැබූ ප්‍රතිලාභ පමණක් වුවත් අධිකාරිය විසින් 2010 වර්ෂය තුලදී එම විධිවිධාන වලට පටහැනිව දිරිදීමනා ගෙවා තිබුණි. |
| (ඈ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය, 1997 ජුනි 27 දිනැති අංක 122 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | අධ්‍යක්ෂකවරුන්ට ගෙවනු ලබන මාසික දීමනාවට සියළුම දීමනාවන් ඇතුලත් වන හෙයින් දිරිගැන්වීමේ දීමනා, ප්‍රසාද දීමනා හෝ වෙනත් වර්ග වල ප්‍රතිලාභ හෝ එවැනි කිසිදු දීමනාවන් නොගෙවිය යුතු වුවත් අධිකාරියේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදේශන සේවා ව්‍යාපෘතියට දායක වීම වෙනවෙන් රු:109,695 ක් දීරි දීමනා ලෙස ගෙවා තිබුණි. |
| (ඉ) 2001 ජනවාරි 03 දිනැති අංක ඒ ටී සී යු/02/160 දරන මහවැලි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභ්‍යන්තර චක්‍රලේඛය | (i) මහවැලි අධිකාරියට අයත් වත්කම් ප්‍රාදේශීය සභාවලට / පළාත් පාලන ආයතන වලට හා රාජ්‍ය ආයතනවලට පැවරීම පිළිබඳ උපදෙස් වලට පටහැනිව දෙහිඅත්තකණ්ඩිය කලාපයේ බාහිර සංවිධාන හා පුද්ගලයන් වෙත නිල නිවාස 06 ක් ලබා දී තිබුණි. |

(ii) රෝහීය ආයතන වෙත පවරනු ලැබූ නිල නිවාස එම ආයතන විසින් නිසි පරිදි පාලනය නොකරන අවස්ථාවක එම නිවාස වල අයිතිය නැවත අධිකාරියට පවරා ගැනීමට හැකි වුවත් දෙහිඅත්තකණ්ඩිය කලාපයේ රෝහීය ආයතන 02 ක් වෙත පවරනු ලැබූ නිල නිවාස 06 ක් එම ආයතන වල නොසැලකිලිමත්කම නිසා අත්හැර දමා අබලන් තත්වයක පැවතුණත් එකී නිවාස නැවත අධිකාරියට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2007 අප්‍රේල් 05 දිනැත අංක 33 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය.

<u>මොරගහකන්ද කළු ගඟ ව්‍යාපෘතිය</u>

- 02 වගන්තිය

ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

- 5.2 සහ 5.3 වගන්ති

(i) ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් තමන්ට හිමි මාසික ඉන්ධන ප්‍රමාණය වූ ලීටර් 145 ඉක්මවා, ඉන්ධන ලබා ගෙන තිබූ අතර එසේ ලබා ගන්නා අතිරේක ඉන්ධන සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ii) ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් මාසිකව ඉන්ධන ලීටර් 75 සිට 400 දක්වා වන පරිදි නිලධාරීන් 33 දෙනෙකු වෙනුවෙන් මාසිකව ඉන්ධන ලීටර් 6145 ක් අනුමත කර තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-------------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය

----------------------

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රජයේ දායකත්වය සහ පෙර වර්ෂ ගැලපීම් සැලකිල්ලට ගැනීමට පෙර රු: 2,205,353,000 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු: 2,080,307,000 ක් විය. රු: 1,730,000,000 ක්වූ රජයේ දායකය ගණන් ගැනීමෙන් පසුව සහ පෙර වර්ෂ ගැලපීම්වලට පෙර සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු: 475,353,000 ක් වූ අතර, රු:1,642,500,000 ක් වූ රජයේ දායකය ගණන් ගැනීමෙන් පසුව සහ පෙර වර්ෂ ගැලපීම් වලට පෙර ඉකුත් වර්ෂයේ ඌනතාවය රු: 437,807,000 ක් විය. මේ අනුව රජයේ දායකය ගණන් ගැනීමෙන් පසුව සමාලෝචිත වර්ෂයෙ මල්‍ය ප්‍රතිඵලය ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය සමඟ සැසඳීමේදී රු: 37,546,000 ක පිරිහමක් පෙන්නුම් කෙරණ.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

#### 2.2.1 කාර්ය සාධනය

-----------------

සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ කාර්ය සාධනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති කළමනාකරණය

----------------------------

පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

(i) මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අලි උවදුරු සඳහා විදුලි වැටවල් සවිකිරීම හා සන්නිවේදන පද්ධතිය වැඩි දියුණු කිරීම සහ පුහුණු වැඩ සටහන්.

මහවැලි සී කලාපය

---------------------

(ii) කාබනික පොහොර භාවිත වැඩසටහන යටතේ දහයියා පුලුස්සන බැරල් සැපයීම.

(iii) ධීවර සංවර්ධන කටයුතු වෙනුවෙන් අධිකාරියේ 50% දායකත්වය මත මාළු දැල් ලබා දීම.

(iii) වගා ළිං ඉදිකිරීම.

(iv) ව්‍යාපාර සංවර්ධන සහ අලෙවිකරණ කටයුතු යටතේ කාන්තා කණ්ඩායම් සඳහා බිම්මල් වගා කිරීමේ පුහුණු පාඨමාලා පැවැත්වීම සහ ක්ෂේත්‍ර අධ්‍යයන (අලෙවි)

පහත සඳහන් ව්‍යාපෘති අවසන් කර නොතිබුණි.

(i) තාක්ෂණ සෙවා කටයුතු යටතේ ගොඩනැගිලි අළුත්වැඩියා කොන්ත්‍රාත් ලබා දීම.

(ii) විශේෂ කිරි ගව වැඩසටහන වෙනුවෙන් කිරි ගවයින් මිලදී ගැනිම.

පහත සඳහන් ව්‍යාපෘති වල කාර්ය සාධනය දුර්වල තත්වයක (50% වඩා අඩු ප්‍රගතියක් සහිත) පැවතුණි.

<u>මහවැලි සී කලාපය</u>

(i) අපි වවමු-රට නගමු වැඩ සටහන යටතේ ගෙවතු 30000ක් සංවර්ධනය සඳහා පැළ බෙදීම, බීජ බෙදීම හා පහුණු වැඩ සටහන් පැවැත්වීම.

(ii) එක් ගමකට එක් භෝගයක් වැඩ සටහන යටතේ මිරිස් , ලොකු ලූණු, සෝයා, බඩ ඉරිඟු,රට කජු,කඩල යන බීජ බෙදාදීමේ වැඩ සටහන

(iii) තාක්ෂණ සේවා යටතේ කඳවුරු නඩත්තු කටයුතු

(ආ) වාර්ෂික ක්‍රියාකාර් සැලැස්ම හා ප්‍රගති වාර්තා

-------------------------------------------------

වාර්ෂික ක්‍රියාකාර් සැලැස්ම හා ප්‍රගති වාර්තා පරීක්ෂා කිරීමේදී ප්‍රමාණවත් කාර්ය සාධනයක් පෙන්වා නොතිබූ වැඩ සටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) රු: මිලියන 86.47 කට ඇස්තමේන්තු කරන ලද වැඩ සටහන් 41ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) රු: මිලියන 42.47 කට ඇස්තමේන්තු කරන ලද වැඩ සටහන් 5ක ප්‍රගතිය 10% ටත් වඩා අඩු විය.

(iii) රු: මිලියන 89.44 කට ඇස්තමේන්තු කරන ලද වැඩ සටහන් 13ක ප්‍රගතිය 10% ත් ,30% ත් අතර විය.

(iv) රු: මිලියන 26.85 කට ඇස්තමේන්තු කරන ලද වැඩ සටහන් 21 ක කිසඳු භෞතික ප්‍රගතියක් ප්‍රගත වාර්තාවල දක්වා නොතිබුණි.

2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

2010 වර්ෂයේ දඹුල්ල යාන්ත්‍රික වැඩපළෙහි සිදුකර තිබූ වාහන අළුත්වැඩියා වෙනුවෙන් අයවිය යුතු රු:856,210 ක් 2011 නොවැම්බර් 14 දිනය දක්වාත් අයකරගෙන නොතිබුණි. සිදුකල අලුත්වැඩියාවන් සඳහා බිල්පත්ද නිකුත්කර නොතිබුණි.

2.2.3 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බාහිර පාර්ශවයන් වෙත ලබාදී ඇති වත්කම්

| විස්තරය | | වත්කම් සංඛ්‍යාව | වටිනාකම රු: | නිරීක්ෂණ |
|---|---|---|---|---|
| (i) | වාහන | 08 | ගණනය කළ නොහැක | කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි |
| (ii) | ගිරාඳුරුකෝට්ටේ සංවර්ධන මධ්‍යස්ථානයට අයත් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල හා උපකරණ | ගණනය කර නොමැත | ගණනය කර නොමැත | බණ්ඩාරවෙල ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාර්ය වෙත ලබා දී තිබුණි. |
| (iii) | දෙහිඅත්තකණ්ඩිය කඳවුරු භූමිය තුල පිහිටි නිල නිවාස | 01 | 609,745 | බාහිර පුද්ගලයකු වෙත ලබා දී තිබුණි. |

(ආ) නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

| වත්කම් වර්ගය | | වත්කම් සංඛ්‍යාව | වටිනාකම රු: | නරීක්ෂණ |
|---|---|---|---|---|
| (i) | දෙහිඅත්තකණ්ඩිය නිල නිවාස | 20 | 14,773,000 | දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව තිබුණි. |
| (ii) | ටයර් හා ටියුබ්, වල්කපන යන්ත්‍ර හා එහි තල, පැළ සිටුවන යන්ත්‍ර | 74 | 360,643 | දෙහිඅත්තකණ්ඩිය ගබඩාවේ දීර්ඝ කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන පවතී. |

| | | | |
|---|---|---|---|
| (iii) ලිපි ද්‍රව්‍ය තොග | නිශ්චය කල නොහැක | තොරතුරු ඉදිරිපත් නොවුණි. | දෙහඅත්තකණ්ඩිය ගබඩාවේ වසර 2ක සිට නිෂ්කාර්යව තිබුණි. |
| (iv) රසායනාගාර අයිතම් | නිශ්චය කල නොහැක | තොරතුරු ඉදිරිපත් නොවුණි. | දෙහිඅත්තකණ්ඩිය ගබඩාවේ දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව තිබුණි. |

2.2.4 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්ය මණ්ඩල කළමනාකරණය

----------------------------------

(i) 1999 වර්ෂයේ අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය අනුව අධිකාර්ය තුල අනුමත සේවක සංඛ්‍යාව 4768 ක් වූ අතර 2010 දෙසැම්බර් 31 දිනට සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 4466 ක් විය. ආයතනයේ සේවක පුරප්පාඩු 302 ක් පැවතියත් සමහර තනතුරු සඳහා නියමිත සේවක සංඛ්‍යාවට වඩා අතිරික්තව සේවකයන් බඳවා ගෙන තිබූ අතර කම්කරු තනතුරු සඳහා පමණක් සේවකයන් 389 දෙනෙකුගේ අතිරික්තයක් විය.

(ii) කොන්ත්‍රාත් සහ අනුයුක්ත කිරීමේ පදනම මත බඳවාගත් සේවකයින් 174 දෙනෙකුගේ තනතුරු, කොන්ත්‍රාත් කාලය සහ සේවයේ යෙදවීම් පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

(iii) අධිකාර්යේ අනුමත සේවක සංඛ්‍යාව තුල නොමැති තනතුරු තිබියදීත්, සමහර තනතුරු සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයන් බඳවා ගෙන තිබියදීත්, එවැනි තනතුරුවල වැඩ බැලීම සඳහා වැඩ බැලීමේ නිලධාරීන් ද පත්කර තිබුණි.

(iv) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය රහිතව "සී" කලාපයේ සේවකයින් 22 දෙනෙකු මාස 8 ක කාලයක් වී අලෙවි මණ්ඩලයට අනුයුක්ත කර අධිකාර්ය විසින් එම කාල පරිච්ඡේදයට වැටුප් ගෙවා තිබුණි.

(v) අධිකාර්යේ ස්ථිර කාර්ය මණ්ඩලයට බඳවාගත් ඉංජිනේරුවරුන් 22 ක්, කළමනාකාර සහකාරවරයකු හා රියදුරන් 07 දෙනෙකු වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ

ව්‍යාපෘතිය වෙත අර්ධ කාලීනව මුදාහැර තිබුණද, ඔවුන් ව්‍යාපෘති සේවයේ පූර්ණ කාලීනව යොදවා ගෙන තිබුණි.

(vi) සමාලෝචිත වර්ෂයේ ගිරාදුරුකෝට්ටේ සංවර්ධන මධ්‍යස්ථානයේ පැවැතවෙන පාඨමාලාවන් අඩු වී තිබූ නිසා එම පාඨමාලාවන්ට සම්බන්ධ කාර්ය මණ්ඩලය ඵලදායී ලෙස සේවයේ යොදවා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) විධිමත් අනුමැතිය නොමැති පත් කිරීම් සහ දීමනා ගෙවීම්

---

(i) අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය තුල මාධ්‍ය උපදේශක තනතුරක් නොතිබියදී, 2008 ජූලි මාසයේ සිට මාස 06 ක කාල සීමාවක් සඳහා රු:75,000 ක මාසික දීමනාවකට මාධ්‍ය උපදේශකවරයකු පත් කර තිබුණි. 2010 ජූලි මාසය දක්වා වරින් වර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ඔහුගේ සේවා කාලය දීර්ඝ කර තිබූ අතර මෙම බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක්ද ලබාගෙන නොතිබුණි.

2008 ජූලි මාසයේ සිට 2010 ජූලි මාසය දක්වා කාලය වෙනුවෙන් දීමනා, ඉන්ධන වියදම් සහ දුරකථන ගාස්තු වශයෙන් රු: 1,787,824ක මුදලක් අධිකාරිය විසින් ගෙවා තිබූ බව විගණනයේදී වැඩිදුරටත් අනාවරණය විය.

(ii) දඹුල්ල යාන්ත්‍රික වැඩපල සඳහා විශේෂඥ යාන්ත්‍රික ඉංජිනේරුවරයකු පත්කර තිබූ නමුත් එවැනි තනතුරක් ඇති කිරීම සඳහා ලබාගත් විශේෂ අනුමැතියක් විගණනය සඳහා ඉදිරිපත් නොවිණි. තවද එම ඉංජිනේරුවරයාගේ පත්වීම් ලිපියේ සඳහන් පරිදි වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ තවත් නම්කල ව්‍යාපෘති ගණනාවක විශේෂඥ යාන්ත්‍රික ඉංජිනේරුවකු වශයෙන් කටයුතු කලයුතු බව සහ ඒ සඳහා එකී ව්‍යාපෘති මගින් වැටුප් ගෙවීම් සිදු කල යුතු බව දක්වා තිබුණි. එසේ වුවත් මෙම නිලධාරියාට මාසිකව රු: 75,000 ක වැටුපක් අධිකාරිය මගින් ගෙවා තිබුනද අදාල ව්‍යාපෘති මගින් එම මුදල් ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(iii) අධිකාරියට පවරාගත් නිරාවිය ගොවිපලේ සහාය කාර්ය මණ්ඩලයේ 07 දෙනෙකු, මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම යටතේ බඳවාගත් සේවකයන් වූ අතර එම සේවකයින්ගේ ඉදිරි සේවා කොන්දේසි සම්බන්ධයෙන් සුදුසු පියවර ගෙන නොතිබූ අතර ඔවුන්ගේ වැටුප් අධිකාරියෙන් ප්‍රතිපූර්ණය කර තිබුණි.

3. **පද්ධති හා පාලන.**

---------------------

පද්ධති හා පාලන අඩුපාඩු සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු වරින් වර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිලිබඳ විශේෂ අවධානය යොමු කල යුතු වේ.

(අ) තොග හා ගබඩා පාලනය.

(ආ) කොන්ත්‍රාත් පරිපාලනය.

(ඇ) කලාප කාර්යාලවල ප්‍රගති වාර්තා සකස් කිරීම.

(ඈ) නිල නිවාස පරිපාලනය.

(ඉ) හිඟ බදු අයකිරීම.

(ඊ) නිරාවිය ගොවිපල සහ දඹුල්ල යාන්ත්‍රික ගොවිපල කළමනාකරණය .